මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015අප්‍රේල් 16 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිසිපරිදි පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 16,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.
(ආ) 1990 වර්ෂය සිදුවූ යුදමය වාතාවරණ අනුව රු. 185,062 ක් වටිනා ලීබඩු උපකරණ විනාශව පත්වී තිබුණි. එම වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.
(ඇ) පුනරාවර්තන වැය විෂයන්වන ටයර් සහ පෝරබෑග් විලදී ගැනීම් වෙනුවෙන් වැයවූ රු. 162,675 ක් වත්කමක් වශයෙන් ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබුණි.
(ඈ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාගය වශයෙන් ලැබුණු මොටර් වාහන පහක වටිනාකම රු. 5,390,000 ක ලෙස තක්සේරු කර තිබූ අතර එම වටිනාකම ගිණුම්වල ගෙන නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

ගිණුම් ප්‍රකාශයේ පෙන්වා තිබූ ගිණුම් එක් එක් ගිණුම් විෂයයක ඉදිරියේ දක්වා තිබූ සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගබඩා ශේෂ | 3,342 | ගබඩා ලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| සේවක ඇප | 2,000 | ඇප ලබාගත් සේවයින් පිළිබඳ විස්තර |

1.3.4 නීති හා රීති සනාදියට අනුකූල නොවීම

දක්වා ඇති නීති සහ රීති සමඟ අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට පරිපාලනය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයේදීද ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 3,170,306 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,652,788 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,482,482 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ සමුච්චිත හිඟ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| බදු කුලී | 2,135 | 1,811 | 302 |
| දඩ මුදල් | 2,566 | 2,302 | 307 |
| වෙනත් ආදායම් | 2,118 | 1,258 | 25 |

2.2.2 වරිපනම් බදු සහ බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශ සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමෙන්තුවෙන් ලවා වාර්ෂික වටිනාකම් තක්සේරු නිරීමට කටයුතුකර නොතිබුණි. සභාවට රු. 5,000,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

2.2.3 උසාවි දඩ මුදල

2014 වර්ෂය අදාල හිඟ උසාවි දඩ මුදල රු. 1,975,000 ක් අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමණාකරණ දුර්වලතා

(අ) ගමනැගුම වැඩ සටහන් යටතේ තාණ්ඩියඩි ක්‍රිඩාංගන ඉදිකිරීම සඳහා ලැබුණු රු. 298,500 ක් තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. 2011 වර්ෂය සිට තැන්පත් ගිණුමේ තිබෙණ මෙම මුදල නිරවුල් කිරීම් කටයුතුකර තොතිබුණි.

(ආ) පළාතේ සංවර්ධන අරමුදලින් ( PSDG ) යටතේ ලැබුණු රු. 1,532,035 තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණු අතර 2011 වර්ෂය සිට තැන්පත් ගිණුමේ තිබෙන එම මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටා ගත යුතු බව පළාත් සභා පළාත් පාලන අමාත්‍යංශයේ 2005 නොවැම්බර් 08 දින අංක 03 දරණ පළාත් පාලන ආයතන ප්‍රතිසංස්කරන චක්‍රලේඛ අංක 08 හි සඳහන් පරිදි අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර 69% සිට 98% දක්වා විචලනයක් නිරීක්ණය වූබැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් රැස්කිරීම
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) ස්ථාවර වත්කම් පාලනය